

fka CHILDREN'S SERVICES INC

# මුල් ළමාවිය පසුබිමක් තුළ සෙල්ලම් කිරීම හරහා ඉගෙනීම

SINHALESE

## සෙල්ලම් කිරීම යනු කුමක්ද?

ලොව පුරා කරන ලද අධ්‍යයනවලින් පෙන්නුම් කර ඇත්තේ ළමයින් අර්ථවත්සෙල්ලම් කිරීමේ ක්‍රියා මත පදනම් කරගත් අත්දැකීම්වල නියැලීම තුළින් ඔවුන්ගේ ඉගෙනීම සහ වර්ධනය සිදු වන බවයි.

*"දරුවන්ගේ බුද්ධිමය, ශාරීරික, සමාජීය සහ නිර්මාණාත්මක හැකියාවන් පුළුල් පරාසයක් තුළ උත්තේජනය කිරීමට සහ ඒකාබද්ධ කිරීමට සෙල්ලම් කිරීම අත්‍යවශ්‍ය වේ. එලදායි මුල් ළමාවිය ක්‍රියාවන් දරුවන් සමග තිරසාර සහ හවුල් අන්‍යෝන්‍ය කටයුතු කිරීම් වලට සහාය වීම සඳහා ඒකාබද්ධ ඉගැන්වීම් සහ ඉගෙනුම් ප්‍රවේශයන් භාවිත කරයි. සෙල්ලම් කිරීම සහ වෙනත් අවස්ථාවන් හරහා ළමයින් දිනපතා මුහුණ දෙන සමාජ හා ස්වභාවික ලෝකය, පුද්ගලයන්, ස්ථාන, වස්තූන් සහ අත්දැකීම් පිළිබඳ අදහස් ගොඩනැගීමට ඉගෙන ගනී."*

- VEYLDF, 2016, පිටුව 14

සෙල්ලම් කිරීම ඔබේ දරුවාට ස්වභාවිකවම පැමිණෙන අතර එය ඔවුන්ගේ ඉගෙනීමේ සහ සංවර්ධනයේ වැදගත් කොටසකි. සෙල්ලම් කිරීම ඔබේ දරුවාට ඔවුන්ගේ ලෝකය පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීමට සහ ශක්තිමත් අනන්‍යතා හැඟීමක් වර්ධනය කර ගැනීමට උපකාරී වේ. සෙල්ලම් කිරීම තුළින් ඔබේ දරුවාට කල්පනා කිරීමට, මවා පෑමට, නිර්මාණය කිරීමට, ගවේෂණය කිරීමට, විමර්ශනයකිරීමට, සන්නිවේදනය කිරීමට, ප්‍රශ්න කිරීමට, කතා කිරීමට, සවන් දීමට, සිතීමට, දැනීමට, ස්පර්ශ කිරීමට සහ සුවඳ විඳීමට හැකියාව ඇති වනු ඇත. සෙල්ලම් කිරීමට සාකච්ඡා කිරීම, ගැටලු විසඳීම, අවදානම් ගැනීම, අලුත් දේවල් උත්සාහ කිරීම සහ දේවල් ක්‍රියාත්මක වන ආකාරය බැලීම ඇතුළත් වේ. ඔබේ දරුවා තමන් සහ අන් අය ගැන ඉගෙන ගැනීම, සෙල්ලම් කිරීමේ දී භාවිත වන නීතිරීති ඉගෙන ගැනීම, මිතුරන් ඇති කර ගැනීම, සබඳතා ගොඩනඟා ගැනීම, ඔවුන්ගේ අධ්‍යාපනඥයින් සහ අනෙකුත් දරුවන් ඇතුළු අවට සිටින අය විශ්වාස කිරීම සිදුකරයි.

දරුවන් බොහෝ විට තනියම සෙල්ලම් කරයි, තවත් එක් දරුවෙකු හෝ දෙදෙනෙකුසමග සෙල්ලම් කරයි, කුඩා හෝ විශාල ළමුන් කණ්ඩායම් වශයෙන් සෙල්ලම් කරයි. සෙල්ලම් කිරීම ඝෝෂාකාරී හෝ නිහඬ, අක්‍රීය හෝ ක්‍රියාකාරී විය හැකිය

*"බාධා නොකරන සෙල්ලම් කිරීමේ කාල පරිච්ඡේද, විවෘතව පවතින ද්‍රව්‍ය සහ සම්පත් රාශියක් භාවිත කරමින් නව නිපැයුම් කිරීමට, විමර්ශනය කිරීමට සහ සොයා ගැනීමට දරුවන්ට කාලය ලබා දෙයි."*

- VEYLDF, 2016, පිටුව 21

## සෙල්ලම් කිරීම ඔස්සේ ඉගෙනීම

ගුරුවරුන් සහ අධ්‍යාපනඥයින් විසින් තමන්ගේ සේවාව ලබා ගැනීමට පැමිණෙන සෑම දරුවෙකුගේම තනි උවමනාවන් සහ අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහනක් සැලසුම් කරයි. ඔවුන් මෙය කරන්නේ දරුවන්ට ගෘහස්ථ සහ එළිමහන් අවකාශයන් අතර නිදහසේ ගමන් කළ හැකි විවෘත ඉගෙනුම් පරිසරයක් තුළ පුළුල් පරාසයකසෙල්ලම් කිරීම පාදක අත්දැකීම් ලබා දීමෙනි.

සංගීතය, කතන්දර සහ සාකච්ඡා වැනි අධීක්ෂණය කරන විධිමත් ක්‍රියාකාරකම් කිහිපයක් තිබෙනු ඇත. දවසේ වැඩි කාලයක්, ළමයින් තමන් සෙල්ලම් කරන්නේ කුණ ස්ථානයක ද , කවුරුන් සමග සෙල්ලම් කරන්නේද සහ ඔවුන් යම් සෙල්ලම් ක්‍රියාකාරකමක් සඳහා කොපමණ කාලයක් ගත කරන්නේ ද යන්න පිළිබඳව තමන් විසින්ම තීරණය කරනු ඇත. දරුවන්ට උපකාර අවශ්‍ය වූ විට අධ්‍යාපනඥයින් සහාය සහ මග පෙන්වීම ලබා දෙනු ඇත.

දරුවන්ට ඉගෙනීමට ඇල්මක් ඇති කර ගැනීමට, කුතුහලය ඇති කිරීමට , විමසිලිමත් වීමට සහ ඔවුන්ගේ ලෝකය සහ ඔවුන් මුණගැසෙන පුද්ගලයන් ගැන උනන්දු වීමට උපකාර කිරීම සඳහා අධ්‍යාපනඥයින් විවිධ ඉගැන්වීම් උපාය මාර්ග භාවිත කරනු ඇත. . ඔවුන් ස්වයං නිරීක්ෂිත සෙල්ලම් කිරීම් වල නිරත වන දරුවන්ගේ සෙල්ලම් ක්‍රියාකාරකම් මෙහෙයවීම, ඒවාට නායකත්වය දීම සහ නිරීක්ෂණය කිරීම සිදු කිරීමට ඉඩ ඇත.

*fka* Children's Services
18 Harper Street, Abbotsford VIC 3067
03 9428 4471 | fkacs@fka.org.au
www.fka.org.au | Facebook @FKACS

## සෙල්ලම් කරන අතරතුර ළමයින් ඉගෙන ගන්නේ මොනවා ද ?

සෙල්ලම් කිරීම තුළින් දරුවන්ට කතා කිරීමට සහ ප්‍රශ්න ඇසීමට, වචන මාලාව සහ භාෂාව, සාක්ෂරතාව, සංඛ්‍යාත්මක කුසලතා සහ සමාජ කුසලතා වර්ධනය කර ගැනීමට සහ පුහුණු කිරීමට අවස්ථාව ලබා දෙයි. සෙල්ලම් කිරීම තුළින්, දරුවන් වෙනත් පුද්ගලයන් සමග සන්නිවේදනය කිරීමට සහ සම්බන්ධ වීමට ඉගෙන ගනී.

දරුවන් විසින් ඔවුන් නිරීක්ෂණය කළ දේ රඟ දැක්වීමට පරිකල්පනය භාවිත කරයි. නිදසුනක් වශයෙන්;

- ආහාර සූදානම් කරන ලෙස හැසිරීම
- ළදරුවෙක් බලාගන්නා ලෙස හැසිරීම
- ගිනි නිවන භටයෙකු, වෛද්‍යවරයෙකු හෝ සාප්පු හිමියෙකු ලෙස හැසිරීම.

මෙය දරුවන්ට ඔවුන්ගේ ලෝකය සහ ඔවුන්ගේ ප්‍රජාව තේරුම් ගැනීමට සහ අවබෝධ කර ගැනීමට ඉගෙන ගැනීමට උපකාර කරයි.

*"ගෝලීය ප්‍රජාවන්ට අයත් වීමේ සංකල්පය ඇතුළුව විවිධ අනන්‍යතා සහ දෘෂ්ටිකෝණ ගවේෂණය කිරීම සඳහා නාට්‍යමය සෙල්ලම් කිරීම වැදගත් වේ. පුද්ගලයන් සහ කණ්ඩායම් අතර සමානකම් සහ වෙනස්කම් අගය කිරීමට සහ විවිධ දෘෂ්ටිකෝණවලට ගරු කිරීමට දරුවන්ට සහාය විය යුතුය."*

- VEYLDF, 2016, පිටුව 18

ඔබේ දරුවා සෙල්ලම් කිරීම් වල යෙදී සිටින අතරතුර, ඔවුන් අන් අයට පිළිගත හැකි හැසිරීම් ඉගෙන ගැනීමට උපකාර කිරීම සඳහා නීති රීති සාකච්ඡා කරනු ඇත. නිදසුනක් වශයෙන්, දරුවන්ට ඔන්චිල්ලාවේ ඔවුන්ගේ වාරය එන තෙක් බලා සිටීම සඳහා නීතිරීති සකස් කළ හැකිය. සෑම කෙනෙකුටම ආරක්ෂිතව සිටීමට, උපකරණ සඳහා සැලකිලිමත් වීමට සහ සාධාරණත්වය සඳහා උපකාර වන නීතිරීති සැකසීමට දරුවන්ට ඉඩ දීම, ඔවුන්ගේ චින්තනයට සහ ගැටළු විසඳීමේ කුසලතාවන්ට උපකාර වන අතර, ඔවුන්ගේ සන්නිවේදන සහ සමාජ කුසලතා මෙන්ම සංඛ්‍යාත්මක සහ සාක්ෂරතා කුසලතා වර්ධනය කිරීමට සහාය වේ.

ඔවුන්ගේ සෙල්ලම් කිරීම තුළ, දරුවන්ට ඔවුන්ගේ පවතින දැනුම හා අදහස් නව හා රසවත් ආකාරයෙන් ගොඩනගා ගත හැකිය.

දරුවන් ඇතැම් ක්‍රියාකාරකම් අවදානමක් ගනිමින්, කුසලතා ඉගෙනීමේ සහ පුහුණු කිරීමෙන් නැවත නැවතත් කළ හැක, උදාහරණ ලෙස;

- ඔවුන් විසින්ම ඉහළ ස්ථානයකට නැගීම
- ජිග්සෝ ප්‍රහේලිකාවක් වුව ද හොඳින් පුහුණු වීම
- ඇඳුම් ඇඳීමහෝ ඒවා නිවැරදි ලෙස සකසා ගැනීම තනියෙන්ම සිදු කිරීම
- පටු දණ්ඩක සමබරතාවය තබා ගැනීම
- ඔවුන් විසින්ම කතුරු භාවිතය
- පැන පැන යාම
- ඔන්චිල්ලාවක් මත හිඳ තමාවම තල්ලු කර ගැනීම

මෙම විශාල හා කුඩා ජයග්‍රහණ දරුවන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ ඉගෙනීමට සහාය වන අධ්‍යාපනඥයින්ට ප්‍රතිලාභ ගෙන දෙයි.

සෙල්ලම් කිරීම දරුවන්ට සැමරීමට, සාක්ෂාත් කර ගැනීමට, සාර්ථක වීමට, වැරදි කිරීමට, පුහුණු කිරීමට, නව තොරතුරු හෝ කුසලතා පරීක්ෂා කිරීමට, අදහස් සැකසීමට සහ නව කුසලතා සහ දැනුම ප්‍රගුණ කිරීමට අවස්ථා ලබා දෙයි.

ඔබේ දරුවා ඉගෙනගන්නේ සෙල්ලම් කිරීම හරහා ය.

---

**පරිශීලන**

Department of Education and Training, 2016. *Victorian Early Years Learning and Development Framework*.